# සංවර්ධන ලොතරැයි මණ්ඩලය

# ලංසු ලියවිලි කට්ටලය

සති අන්ත/ නිවාඩු දිනවල දිවා ආහාර සැපයිම - **2025**

ලංසු අංකය **: DLB/PRO/2025/03**

draft

ලංසුකරුගේ නම **:- -----------------------------------------------------------------**

ලදුපත් අංකය **:- -----------------------------------------------------------------**

නිකුත් කලේ **:- -----------------------------------------------------------------**

**සංවර්ධන ලොතරැයි මණ්ඩලය**
**356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,**
**කොළඹ 02.**

## සංවර්ධන ලොතරැයි මණ්ඩලය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## ලංසු සඳහා ආරාධනයයි

**<u>සතිඅන්ත හා නිවාඩු දින  සඳහා  කාර්යාලීය දිවා ආහාර සැපයීම - 2025</u>**

**<u>ලංසු අංකය :- DLB/PRO/2025/03</u>**

මෙම ආයතනයට ඉදිරි වසරක කාලයක් සඳහා සති අන්ත හා නිවාඩු දිනවල කාර්යාලීය දිවා ආහාර සැපයීම වෙනුවෙන් යෝග්‍ය සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට සුළු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මේ පිලිබඳව උනන්දුවක් දක්වන පලපුරුදු සේවා සපයන්නන් වෙතින් ලංසු ඇරයුම් කෙරේ.
ලංසුකරුගේ ආහාර සැකසීමේ ස්ථානය මෙම කාර්යාලයේ සිට කි.මී. 25 ක පමණ දුරපරාසයක් තුල පිහිටි ස්ථානයක් විය යුතු අතර ලංසුකරු අදාල පළාත් පාලන ආයතනය විසින් ආහාර සැකසීම හා අලෙවි කිරීම/ආහාර සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යෑම වෙනුවෙන් නිකුත් කරනු ලබන බලපත්‍රලාභී සැපයුම්කරුවෙකු විය.

02. මේ සඳහා දේශිය විවෘත තරඟකාරී ක්‍රමය මත ලංසු කැඳවනු ලැබේ.

03. මේ සඳහා වන ලංසු ලියවිලි කට්ටලය 2025.01.28 සිට 2025.02.14 දක්වා කාර්යාල වේලාවන් තුලදී ප්‍රසම්පාදන අංශයෙන් නොමිලයේ පරීක්ෂා කල හැකිය. ලංසු ලියවිලි කට්ටලය ආයතනයේ ලිඛිත ඉල්ලීමක් මත ආපසු නොගෙවනු ලබන රු. 2,360.00 ක (18% වැට් බදු සහිතව) පෝරම ගාස්තුවක් මුදලින් පමණක් ගෙවීමෙන් 2025.01.28 සිට 2025.02.14 දක්වා පහත ලිපිනයෙහි පිහිටි ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැක.

04. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි කට්ටලය  සභාපති, සුළු ප්‍රසම්පාදන කමිටුව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය, අංක 356, ආචාර්ය කොල්වින් ආර්.ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02 ලිපිනයට  2025.02.17 දින ප.ව 2.30 ට පෙර ලැබෙන සේ හෝ ලියාපදිංචි තැපැල් මගින් එවීම හෝ එම ලිපිනයෙහි පිහිටි ප්‍රසම්පාදන  අංශයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය හැකිය.

05.  ලංසු කෝන්දේසි අංක 17 ලංසු ලියවිලි සමඟ ආපසු ගෙවන ඇප තැන්පතු මුදලත් තැබිය යුතුය. (ඇප තැන්පතු නොගෙවීම ලංසු මිල ගණන් ප්‍රතික්ෂේප වීමට හේතු වනු ඇත.)

06. මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ “සතිඅන්ත හා නිවාඩු දිනවලදී කාර්යාලීය දිවා ආහාර සැපයීම”සඳහා මිළ ගණන් කැඳවීම - 2025” යනුවෙන් සඳහන් කල යුතුය.

07. ලංසු භාර ගැනීම 2025.02.17 දින දක්වා සිදු කරන අතර ලංසු භාර ගැනිම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාව  සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැකිය.

සභාපති,
සුළු ප්‍රසම්පාදන කමිටුව,
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අංක356, ආචාර්ය කොල්වින් ආර් . ද සිල්වා මාවත,
යූනියන් පෙදෙස, කොළඹ 02.
011-4824824
procurement@dlb.lk
2025.01.28

DEVELOPMENT LOTTERIES
මුදල් අමාත්‍යාංශය

DLB/PRO/
2025.01.28

---------------------------------------------

---------------------------------------------

---------------------------------------------

---------------------------------------------

මහත්මයාණෙනි,

**<u>සති අන්ත හා නිවාඩු දිනවල කාර්යාලීය දිවා ආහාර සැපයීම සඳහා ලංසු මිල ගණන් කැඳවීම - 2025</u>**
**<u>ලංසු අංකය DLB/PRO/GEN/2025/03</u>**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දිනවලට අදාලව වසරක කාලයක් සඳහා දිවා ආහාර පාර්සල් සැපයීමට යෝග්‍ය සැපයුම්කරුවකු තෝරා ගැනීම වෙනුවෙන් සුළු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙවැනි අහාර සැපයීම් කරනු ලබන පිළිගත් හා සුදුසුකම් ඇති සැපයුම්කරුවන් වෙතින් පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව ලංසු කැඳවනු ලැබේ. ගිවිසුම් ගත වසරක කාලයක් පුරා එකඟ වූ මුදලට ආහාර සැපයීම සිදු කල යුතු අතර මිල ගණන් වැඩි කිරීමක් සිදු නොකෙරේ.

**<u>කොන්දේසි.</u>**

01. ලංසු මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලංසුකරු ආහාර සැපයීමේ ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කර තිබිය යුතුය. ආහාර සැපයීමේ ස්ථානය / මුළුතැන්ගෙය මෙම කාර්යාලයේ සිට කි.මී.25 ක පමණ දුරපරාසයක් තුල පිහිටි ස්ථානක් විය යුතුය.

02. ලංසුකරුට මෙවැනි ආහාර සැපයීමේ සමාන මට්ටමේ කොන්ත්‍රාත්තු ඉටුකිරීම පිළිබඳව අවම වශයෙන් වසර 02 ක පලපුරුද්දක් තිබිය යුතුය. (ඒ පිළිබඳ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතුය)

03. ලංසුකරු තම ආයතනය පිහිටි පළාත් පාලන ආයතනය විසින් ආහාර අලෙවි කිරීම/ ආහාර සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යෑම වෙනුවෙන් නිකුත් කරනු ලබන බලපත්‍රය ලබා තිබිය යුතුය.

04. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ සමාගම් ලියාපදිංචි සහතිකයේ පිටපතක් මිල ගණන් සමඟ අමුණා තිබිය යුතුය.

05. සෙනසුරාදා දිනවල දල වශයෙන් දිවා ආහාර පැකට් 150 ක් පමණද ඉරිදා දිනයන්හි 110 ක් පමණද අවශ්‍ය වන අතර, ඊට අමතරව පෝය දින හා සතියේ දිනවල පවතින රජයේ නිවාඩු දිනයන්හිද දිවා ආහාර සැපයිය යුතුවේ. අදාල දිනට අවශ්‍ය ආහාර පැකට් ගණන දල වශයන් ඊට පෙර දින සවස දන්වන අතර අදාල දින පෙ.ව 9.30 ට පමණ අවශ්‍ය නිවැරදි පැකට් ගණන ඔබ වෙත දුරකථනයෙන් දැනුම් දෙනු ලැබේ.

06. දිවා ආහාර පාර්සල් දහවල් 12.00 ත් 12.30 ත් අතර කාලය තුල ප්‍රධාන කාර්යාලයට ගෙනවිත් භාර දිය යුතුය.

07. ආහාර පැකට් එකක සාමාන්‍ය බර 650g – 700gට නොඅඩු විය යුතුය. එහි බත් 250g -300g, මස් හෝ මාළු 120g පමණ කැබැල්ලක්(තලපත් හෝ එවැනි සමාන වර්ගවල මාළු) ව්‍යංජන එක් වර්ගයක් 60gක පමණ ප්‍රමාණයට ගැලපෙන පරිදි ඇතුලත් විය යුතුය.

08. එසේම අපේක්ෂිත ආහාර වට්ටෝරු ඇමුණුම් අංක 01 යටතේ මේ සමඟ අමුණා ඇති අතර,එම ආහාර වට්ටෝරු පිළිබඳ සැලකිල්ලට ගෙන වඩාත් රසවත් හා ඒකාකාරි නොවන අයුරින් දෛනික ආහාර වට්ටෝරුව සැපයුම්කරුට තීරණය කල හැක. එම ආහාර වට්ටෝරු මණ්ඩලය මගින් ලබා දි ඇති ආහාර වට්ටෝරු ආකෘතිය තුල පැවතිය යුතු අතර එම කරුණු සැලකිල්ලට ගෙන මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කල යුතුවේ.

09. ආහාර සැකසීම සඳහා රසකාරක ද්‍රව්‍ය භාවිතා නොකල යුතු අතර, සෞඛ්‍ය සම්පන්නව ආහාර සැකසීම සඳහා නිර්දේශිත පොල් තෙල් පමණක් භාවිතා කළ යුතුය. ආහාර පිළියෙල කල යුතු උපදෙස් මාලාවක් ඇමුණුම් අංක 02 යටතේ මේ සමඟ අමුණා ඇති අතර එම උපදෙස් අනුව ආහාර පිළියෙල කල යුතුය.

10. මස් /මාළු/එළවළු /බිත්තර අඩංගු ආහාර පැකට් වර්ග හඳුනා ගැනීම සඳහා මතුපිට සළකුණු කර තිබිය යුතුය.

11. සපයනු ලබන ආහාර පැකට් පිරිසිදුව, ප්‍රනීතව හා සෞඛ්‍ය සම්පන්නව සැපයිය යුතුය.

12. ආහාර ඇසුරුම් කිරීම අනුමත ඇසුරුම් කොල භාවිතා කල යුතු අතර කාඩ්බෝඩ් භාවිතයෙන් සකස් කරන ලදපෙට්ටියක ආහාර ඇසුරුම් කළ යුතුය.(නොදිරණ ඇසුරුම් පෙට්ටි භාවිතා නොකල යුතුය.)

13. තෝරා ගන්නා සැපයුම්කරුට මෙම කොන්ත්‍රාත්තුව වෙනත් පාර්ශවයකට පැවරිය නොහැක.

14. ඔබ ආයතනයේ ආහාර පිළියල කිරීම පිළිබඳව අවස්ථානුකූලව පෙර දැනුම්දීමකින් තොරව පරික්ෂා කිරීමට මණ්ඩලයට බලය ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා දිය යුතුය.

15. පරිභෝජනයට නුසුදුසු (නරක්වූ/පිළුනුවූ) ආහාර සැපයීම සිදුකර තිබුණහොත් මණ්ඩලය විසින් තීරණය කරන දඩමුදලක් සැපයුම්කරුගෙන් අයකරගැනීමට කටයුතු කෙරේ.

16. එමෙන්ම ඔබ විසින් සපයන ආහාරවල තත්වය අසතුටුදායක බව අප ආයතනයට හැඟී ගියහොත් හෝ ඉහත අංක 07 හි පරිදි අදාල ප්‍රමාණයන් ගෙන් මස් මාළු ව්‍යාංජන නොමැති නම් එදිනට ආහාර පාර්සල් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි අවස්ථාවල ඔබට දැරීමට සිදුවන වියදම පිළිබඳ වගකීම සංවර්ධන ලොතරැයි මණ්ඩලය බාර නොගනී. එවැනි අවස්ථාවකදී කෙටි දැනුම් දීමකින් ඔබගේ සේවාව අවලංගු කිරීමට මණ්ඩලයට බලය ඇත.

17. මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කිරිමේදි රු 25,000.00 ක ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදලක් මණ්ඩලයට ගෙවා ලබාගත් ලදුපතේ පිටපතක් මිල ගණන් පත්‍රිකාව සමඟ ඉදිරිපත් කලයුතුය. එම ටෙණ්ඩර් ඇප මුදල නොගෙවීම ඔබගේ මිලගණන් පත්‍රිකාව ප්‍රතික්ෂේප වීමට හේතුවන බව සැලකිය යුතුය.

18. මේ සමඟ අමුණා ඇති ඇමුණුම් අංක 03 හි මිල ගණන් පෝරමය මගින් මිල ගණන් ඉදිරිපත් කල යුතු අතර අමතර තොරතුරු මිල ගණන් සමඟ ඉදිරිපත් කල හැක. එකවරක් සටහන් කල මිල ගණන් වෙනස් කිරීමකදී තනි ඉරකින් එම මිල ගණන් අවලංගු කොට නව මිල ගණන් සඳහන් කල යුතු අතර එම ස්ථානයේ ලංසුකරුගේ සම්පූර්ණ අත්සන යෙදිය යුතුය

19. සපයනු ලබන ආහාර අනුභව කිරීම හේතුකොට ගෙන යම් පුද්ගලයෙකුට හෝ පිරිසිකට යම් අසාද්මික තාවයක් ඇතිවුවහොත් එහි පූර්ණ වගකීම සැපයුම්කරු සතුවේ.

20. මුදල් ගෙවීම ඉන්වොයිසිය ඉදිරිපත් කිරීමෙන් පසු සතිපතා චෙක්පතක් මගින් සිදු කෙරේ.

21. සම්පූර්ණ කරන ලද මිල ගණන් පත්‍රය **2025/02/17** දින ප.ව. 2.30ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් සභාපති, සුළු ප්‍රසම්පාදන කමිටුව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය, කොල්වින් ආර් ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02. ලිපිනයට එවීමට හෝ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රසම්පාදන අංශයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් ඇසුරුමේ බහාලිය හැකිය.

22. ලංසු විවෘත කිරිමෙන් පසු සාම්පල කැඳවනු ලබන අතර ඒ අනුව සාම්පල ඉදිරිපත් කල යුතුය. එහිදී සාම්පල ඉදිරිපත් නොකිරීම ලංසු ප්‍රතික්ෂේප වීමට හේතු වනු ඇත.

23. මුදල් ගෙවීමේදි රජයේ බදු පිළිබඳ නිති රීති අදාල වේ.

24. තෝරාගන්නා සැපයුම්කරු මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

25. ලංසු පැවරීමෙන් පසු ආහාර සැපයිමට තෝරාගන්නා සැපයුම්කරු ආපසු ගෙවනු ලබන රු 100,000.00ක ටෙන්ඩර් ඇප තැන්පතු මුදලක් ලංසු පැවරුම් දින සිට දින 07 ක් ඇතුලත මණ්ඩලයේ තැන්පත් කලයුතු අතර කොන්ත්‍රාත් කාලය අවසානයේ එම ඇප මුදල නිදහස් කරනු ලැබේ.

26. සපයනු ලබන ආහාර දිනපතා මණ්ඩලයේ නිලධාරින් විසින් පරික්ෂා කරනු ලැබේ. අදාල ප්‍රමිතියෙන් හා ඉහත පිරිවිතරයන්ගෙන් පරිබාහිර වන අවස්ථාවන්හි, එම ආහාර ආයතනය විසින් බාර නොගන්නා අතර ඒ සඳහා මණ්ඩලය මුදල් ගෙවීමටද බැඳී නැත.

සභාපති,
සුළු ප්‍රසම්පාදන කමිටුව,
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අංක 356, කොල්වින් ආර් ද සිල්වා මාවත,
යුනියන් පෙදෙස,
කොළඹ 02.

draft

ඇමුණුම් අංක - 01

## ආහාර වර්ගය- සාමාන්‍ය බත් ව්‍යාංජන සහිතව( RICE AND CURRY)

| ආහාර සංයුතිය | එලවලු කෑම | මාළු කෑම | කුකුල් මස් කෑම |
|---|---|---|---|
| බත් 250 – 300g | කිරි සම්බා | කිරි සම්බා | කිරි සම්බා |
| මාළු/මස් (120g පමණ කැබැල්ලක්) | - | තලපත්/පරා /කෙලවල්ලා හෝ සමාන වර්ග | කුකුළු මස් |
| එලවළු එක් වර්ගයක් 60g පමණ | අවම වශයෙන් උඩරට එළවළුවක් ඇතුලත්ව එළවළු වර්ග 03ක් තිබිය යුතුය | | |
| ධාන්‍ය (60 g) | පරිප්පු,කඩල වැනි ධන්‍ය ව්‍යාංජන වර්ගයක් | | |
| බිත්තර | - | තැම්බූ බිත්තර -01 | තැම්බූ බිත්තර -01 |
| වෙනත් 01 | කොලමැල්ලුමක් හෝ සම්බෝලයක් | | |
| වෙනත් 02 | මිරිස් බැදුම හෝ වෙනත් | මිරිස් බැදුම /කරවල බැදුම හෝ වෙනත් | මිරිස් බැදුම /කරවල බැදුම හෝ වෙනත් |
| වෙනත් 03 | හතු සළාදයක් හෝ ඊට සමාන වෙනත් ව්‍යාංජනයක් | - | - |

draft

## ආහාර වර්ගය - ෆරයිඩ් රයිස් (fried rice)

| ආහාර සංයුතිය | එලවලු | මාළු | කුකුල් මස් |
|---|---|---|---|
| බත් 250 -300g | බාස්මති | බාස්මති | බාස්මති |
| මාළු/මස් (120g පමණ කැබැල්ලක්) | - | තලපත්,පරා හෝ සමාන වර්ග | කුකුළු මස් |
| ව්‍යාංජන (60g) | චොප්සියක් හෝ බටු මෝජු (හෝ ගැලපෙන ව්‍යාංජනයක්) | | |
| තෙම්පරාදු බිත්තර 01 /කට්ලට් 01 (80 g) | කට්ලට් 01 | තෙම්පරාදු කල බිත්තර 01 /කට්ලට් 01 | තෙම්පරාදු කල බිත්තර 01 /කට්ලට් 01 |
| වෙනත් 01 | එළවළු සලාදයක් හෝ අන්නාසි කැල්ලක් හෝ සමාන වර්ගයක් | | |
| වෙනත් 01 | මැලේ අච්චාරු හෝ චිලි පේස්ට් හෝ සමාන වර්ගයන් | | |
| වෙනත් 03 | හතු ව්‍යාංජනයක් හෝ ඊට සමාන වෙනත් ව්‍යාංජනයක් | - | - |

❖ මෙය ආහාර වට්ටෝරුවේ ආදර්ශයක් පමණි. ඒකාකාරව මෙම වට්ටෝරුව යටතේ පමණක් ආහාර සැපයීම අපේක්ෂා නොකෙරේ.

## ඔබ ආයතනය විසින් සකස් කරන ආහාර පිලියෙළ කළයුතු ආකාරය පිළිබඳ උපදෙස් පත්‍රිකාව.

### බත්

1. සිහින් පොඩි ඇට සහිත කීරි සම්බා විය යුතුය.
2. බත් එකට ඇලී අමුවෙන් බාගෙට තැම්බි නොතිබිය යුතු අතර ඒවා එකිනෙකට වෙන් වෙන්ව තිබිය යුතු අතර ඒවා තෙත බරිත නොවී සාමාන්‍ය වියළි තත්වයෙන් තිබිය යුතුය.
3. බත් සුවඳවත්ව තබා ගැනීම සඳහා පිරිසිදු කරන ලද රන්පේ ආදිය දමා නැවුම්ව සකස් කල යුතුය. ඊට අමතරව වෙනත් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම භාවිතා කල හැක.
4. ගල් වැලි නොමැතිව බත් සකස් කර ගත යුතුය.
5. ලංසු කොන්දේසි පත්‍රිකාවේ ලබා දී ඇති බත් ප්‍රමාණය පැකට්ටුවේ අඩංගු විය යුතුය.

### මාළු

1. මාළු කැල්ල හොදට පිරිසිදු කර කොරපොතු සියල්ල ඉවත් කර පිසීමට ගත යුතුය.
2. අලුත් මාළු භාවිතයට ගත යුතුය.
3. අවම වශයෙන් මාළු කැල්ලක ප්‍රමාණය 120g ක් පමණ විය යුතුයි.
4. මිරිස් තුන පහ ආදිය උසස් තත්වයේ ඒවා විය යුතු අතර ව්‍යංජනයට ගැලපෙන පරිදි යෙදිය යුතුය.
5. අබ, ගම්මිරිස්, කරදමුංගු, සුදු ලූනු, කොත්තමල්ලී ආදී කුළු බඩු වර්ග අවශ්‍ය පමණ ව්‍යාංජනයට යොදා රසවත්ව මාළු සකස් කිරිමට කටයුතු කලයුතුය.
6. මාළු කැල්ලට හොදට තුනපහ ආදිය ලැබෙන පරිදි පිසගත යුතු අතර මාළුකරිය ප්‍රණීත රසයක් හා සුවඳක් ලබා දිමට හැකි උපරිම අයුරින් කටයුතු කල යුතුය.

### ව්‍යංජන

1. ව්‍යංජන ප්‍රමාණවත් පරිදි බෙදා තිබිය යුතුය.(ආහාර ගැනීමේදී ව්‍යංජන අවසන් නොවන ලෙසට)
2. උසස් තත්වයේ තුනපහ භාවිතා කල යුතුය.
3. උකු පොල් කිරි භාවිතා කර ව්‍යාංජන රසවත්ව සකස් කළ යුතුය.
4. කුළු බඩු වර්ග ආදිය අවශ්‍ය පරිදි භාවිතා කළ යුතුය.
5. බී ලූණු , අමු මිරිස්, කැලි මිරිස්, තක්කාලි ආදිය ව්‍යංජන රසවත් කරන ඒවා භාවිතා කළ යුතුය.
6. රන්පේ, කරපිංචා, කරාබු නැටි ආදිය සුවඳවත් කරන ද්‍රව්‍ය එකතු කල යුතුය.
7. පොල් සම්බෝල දෙහි දමා රසට පිළියෙළ කල යුතුය.
8. මිරිස් කරලක් බැද තිබිය යුතුය.(එක පැකට්ටුවකට)

draft

**<u>බිත්තර කෑම</u>**

1. සම්පූර්ණ නැවුම් බිත්තරයක් තිබිය යුතුය.
2. සුදු ලූණු , කරපිංචා, බී ලූණු, ගම්මිරිස් , අමු මිරිස් ආදිය ද්‍රව්‍ය භාවිතා කර බිත්තරය බැද තිබිය යුතුය.
3. කෘත්‍රිම ද්‍රව්‍ය නොදමා බිත්තරය බැද තිබිය යුතුය (පිටි වර්ග නොදැමිය යුතුය)

**<u>මස් කෑම (කුකුල් මස්/ඌරු මස්)</u>**

1. මස් කෑල්ල ප්‍රමාණවත් පරිදි තිබිය යුතුය
2. අවම වශයෙන් මස් කෑල්ලක ප්‍රමාණය 120g ක් පමණක් විය යුතුයි.

**<u>විශේෂ උපදෙස්</u>**

1. කෑම පැකට්ටුව අවම වශයෙන් 650g -700g බරකින් යුතුව තිබිය යුතුය.( බත් 250g -300g,මස් 120g, මාළු 120g (තලපත් හෝ පරා) ව්‍යාංජන එක් වර්ගයක් 60g බැගින් වන සේ )
2. ලබාදෙන ආහාර ලේඛනය ඒ අයුරින්ම තිබිය යුතු අතර එය වෙනස් කිරීමට අවශ්‍ය නම් එය පිළිබඳව කලින් විමසිය යුතුය.
3. ඔබට ලබාදී ඇති උපදෙස් වලට අනුකූල ව ඇණවුම සකස් කල යුතුය.
4. කෑම රසවත්ව හා පිරිසිදුව ලබාදීම කල යුතුය.
5. ඔබ සපයන ආහාර නිරන්තර පරික්ෂාවට ලක් කෙරෙන අතර, ලබා දී ඇති උපදෙස් වලට අනුකූල නොවන ආහාර සැපයුම් නතර කිරීමට සිදුවේ.
6. අවශ්‍ය ප්‍රමිතියෙන් යුතුව ප්‍රවාහන පහසුකම් සැලසිය යුතු අතර ආහාර අඩංගු ඇසුරුමෙහි ප්‍රමිතිය වෙනස් නොවන පරිදි ප්‍රවාහනය කර මණ්ඩලය වෙත භාරදීම සැපයුම්කරුගේ වගකීම වේ .

draft

ඇමුණුම 03

## සංවර්ධන ලොතරැයි මණ්ඩලය
## සති අන්ත / නිවාඩු දින දිවා ආහාර සඳහා මිල ගණන් ඉදිරිපත් කිරිම
## මිල ගණන් පෝරමය

1. ආයතනයේ නම හා ලිපිනය ------------------------------------------------------------------------
   ……………………………………………………………………………………
   ……………………………………………………………………………………
2. මුළුතැන්ගේ පිහිටි ස්ථානීය ලිපිනය ……………………………………………………………………………
   ……………………………………………………………………………………
   ……………………………………………………………………………………
3. ආහාර සැකසීම් ස්ථානයේ සිට මෙම ආයතනයට ඇති දුර කි.මී……………………………………………
4. ව්‍යාපාරය ලියාපදිංචි අංකය ------------------------------------------------------------------------
5. ලියාපදිංචි දිනය ……………………………………………………………………………………
6. වැට්බදු(Vat) ලි/ප අංකය ……………………………………………………………………………………
7. දුරකථන අංකය ------------------------------------------------------------------------
8. ඇණවුම් සම්බන්ධීකරණ නිලධාරින්ගේ නම් ------------------------------------------------------------

draft

| | ආහාර වර්ගය (ලබා දී ඇති ආහාර සංයුතියට අදාලව) | එක් ආහාර පාර්සලයක මිල | | | |
|---|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය බත් සමඟ ව්‍යාංජන (Rice and curry) | මිල | වැට් බදු මුදල | මුළු මුදල | මුළු මුදල අකුරින් |
| | එලවළු බත් | | | | |
| | මාළු | | | | |
| | කුකුල් මස් | | | | |
| 02 | ෆ්‍රයිඩ් රයිස්(Fried Rice) | | | | |
| | එලවළු | | | | |
| | මාළු | | | | |
| | කුකුල් මස් | | | | |

- පසුගිය වසර 02 ක කාලය තුල මෙවැනි ආහාර සැපයීම් කාර්යය ඉටු කර ඇති ආයතන පිළිබඳ තොරතුරු

| ආයතනය | දුරකථන අංකය | ගිවිසුම් කාලය |
|---|---|---|
| 1. ………………………… | ………………………… | ………………………… |
| 2. ………………………… | ………………………… | ………………………… |
| 3. ………………………… | ………………………… | ………………………… |

- දැනටමත් මෙවැනි ආහාර සැපයීම් සිදු කරමින් පවතින රාජ්‍ය හෝ පුද්ගලික ආයතන පිළිබඳ තොරතුරු

| <u>ආයතනය</u> | <u>දුරකථන අංකය</u> | <u>ගිවිසුම් කාලය</u> |
|---|---|---|
| **1.** .............................. | ........................... | ............................. |
| **2.** ............................... | ........................... | ............................. |
| **3.** ............................... | ............................ | ............................. |

ඉහත තොරතුරු නිවැරදි බවත් සියළුම ටෙන්ඩර් කොන්දේසි වලට එකඟව මිල ගණන් ඉදිරිපත් කරනු ලබන බවත් මෙයින් සහතික කරමි.

--------------------------------- ---------------------------

ටෙන්ඩර්කරුගේ අත්සන හා මුද්‍රාව/තනතුර දිනය

නම - ...............................................

draft